
**සිඩ්නිවාසී ඥානතිලක හේවාගමගේ ගේ "ඇවිළිණි කුමරි බඹසර" කාව්‍ය ග්‍රන්ථය දැන් නිකුත් වී ඇත.**
**මිල රුපියල් 200කි.**
**කර්තෘ ප්‍රකාශනයකි.**

**ජගත් ජේ එදිරිසිංහ**






සඳැස් කවිය අපේ ජන ජීවිතයට ඉතා සමීප ය. ඈත අතීතයේ සිටම කවිය ජන හදවතට සමීපව තිබුණේ සඳැස් කවියා පෑ පෙළහර නිසා ය. මතකයෙන් කවියක් ගායනා කරන්නට අපේ ජනයාට හැකි වූයේ ද සඳැස් කවියේ වූ සුගායනීය ලක්ෂණය නිසාම ය. එළිසමය තබා විරිතද රක ගනිමින් නියමිත මාත්‍රා ගණනට අනුව සඳැස් කවියක් ලිවීම අපහසු කාර්යයකි එනිසාම දෝ සඳැස් කවිය අද අපේ කවියන් අතින් ගිලිහෙමින් තිබෙන බවක් පෙනෙයි. මේ අසීරු ගමන් මගේ ගමන් කරමින් සඳැස් කවියෙන් පොතක් ලිවීම ම හපන් කමකි මෑතකදී ඒ හපන්කම කරන්නේ සිඩ්නි වාසී ඥානතිලක හේවාගමගේ ය.

ඥානතිලක හේවාගමගේ ගේ "ඇවිළිණි කුමරි බඹසර" කාව්‍ය ග්‍රන්ථය කියවීම ඉතා රසවත් අත්දැකීමකි.

"ඇවිළිණි කුමරි බඹසර" ඥානතිලක හේවාගමගේ ඇතින් නිර්මාණය වූ දෙවන කාව්‍ය සංග්‍රහයයි. මෙයට පෙර ඔහු ජීවන ගසේ අරටුව කාව්‍ය සංග්‍රහය අප හමුවේ තැබුවේ කවි මගෙය බොහෝ දුර යන්නට ඔහුට හැකියාව ඇති බව පසක් කරමින් ය.

"ඇවිළිණි කුමරි බඹසර" කෘතියට පාදක වන්නේ බෞද්ධ සාහිත්‍යයේ එන "චුල්ලධනුර්ධර" ජාතකයයි. මේ අපූරු කතාව කවි 160 කින් ඉදිරිපත් කරන්නට ඥානතිලක හේවාගමගේ සමත් වෙයි. මේ සියලු කවි මනා ලෙස එළිසමය පිහිටුවා ලියන ලද කවි වෙයි.

කවි පන්තිය

ශිල්ප ඉගෙනුමට පිටත්ව යාම
තක්සලාවේ පළමුවන පාඩම
විවේකය සහ කුමරිය හමුවීම
සතුටු සාමීචිය සහ ආදරයෙන් බැඳීම
ආදි වශයෙන් සර්ග 25 කට බෙදා ඇත.

එක් එක් සර්ග යටතේ ඉදිරිපත් වන කවි ගෙන එන රසය අති මහත්ය. ඒ සෑම කවියක්ම නිර්මාණකරුවාගේ කුසලතාවට සාක්ෂි සපයයි.

| | | |
|---|---|---|
| සැපත් | වී නුවර ගුරු දෙව් හද | බන්දා |
| රැගත් | පඬුරු දී ඔහු දෙපතුල් | වැන්දා |
| නැකත් | හෝරාව එළඹුම කල් | හින්දා |
| වටත් | පිටත් නන් විසිතුරු රස | වින්දා |

(3 වන පිට)

| | | |
|---|---|---|
| මල් බර | වදුල බිම හෙලු සුදු | වළාවකී |
| සන්වර | ලෙසට රැස් සමනල් | රටාවකී |
| සුන්දර | හැඟුම් නව දළු ලන | විමානෙකී |
| පෙම්බර | හිතට නම් මෙය රස | ගුලාවකී |

(5 වන පිටුව)

| | | |
|---|---|---|
| තඹුරු | පිපිලා නිල් දිය පිරුණු | විල |
| මොනරු | රඟනවා එපිටින් පෙනෙන | ගල |
| ළහිරු | රැස් වැටී දිලිසෙයි බසින | හෙල |
| මහරු | සැපයක්ය නිසසල වනය | තුළ |

(21 වන පිටුව)

කුමරා සහ වැදි රජ අතර සිදුවන සටන විස්තර කිරීමේදී කවියා පෙන්වන කුසලතාව බලන්න.

| | | |
|---|---|---|
| විසිරෙයි | ගිනි පුපුරු ලෝහය එකට | ගැටී |
| පිටවෙන් | ඇස් වලින් වෛරය සිතෙහි | කැටී |
| බැරිවෙයි | සමනයට හදවත් නපුරෙ | වැටී |
| සිව්දෙයි | එකෙක් බල කරුමය කරපු | හැටී |

(29 වන පිටුව)

කාව්‍යකරණයෙහි ලා තමා සතු ශක්‍යතාව යොදා ගනිමින් මිනිස් ජීවිතය පිළිබඳ අපූරු විවරණයක් අපට ගෙනෙන්නට කවියා සමත් වෙයි. මෙහිදී මිනිස් සිත විවරණය කරමින් ඔහු දක්වන අදහස් ඉතා වැදගත් ය.

වගීෂ තිලකරත්නගේ සිතුම් පොතෙහි වටිනාකම තවත් වැඩි කරයි.

"ඇවිළිණි කුමරි බඹසර" කෘතිය අපට පුද දෙන කවියා වෘත්තියෙන් විද්‍යාඥයෙක් වීම විශේෂත්වයකි. ප්‍රකාශ තන්ත්‍ර විද්‍යාව පිළිබඳ විශේෂඥයකු වන හේවාගමගේ අතින් මෙවන් සාහිත්‍ය කෘතියක් නිර්මාණය වී පැසසුම් කටයුතු ය.

---

# කසුනි මෙන්ඩිස්
## වික්ටෝරියාවේ කේසි නගරසභාවට තරග වදියි



**ප්‍රියන්තා ධීරසුන්දර**

ඇය නමින් කසුනි මෙන්ඩිස්ය. උගත් සංක්‍රමණික යුවලකගේ දියණියක වන ඇය ඕස්ට්‍රේලියාවේම උපත ලද්දියක් වීම විශේෂයකි.

කසුන් මෙන්ඩිස් මෙවර City of Casey නගර සභාවේ Spring Field ආසනයට තරඟ කිරීමට නාම යෝජනා භාර දී ඇත. සිංහල භාෂාව මනා ලෙස හසුරවන ඇය වික්ටෝරියාවේ සිංහල භාෂා පාසල හා දහම් පාසල් ඇසුරින් සිංහල භාෂාව හා බුද්ධාගම ඉගෙන ගෙන ඇත. කුඩා කල මෙල්බර්න් නුවර ගුවන් විදුලියේ සිංහල ළමා වැඩසටහන්ද මෙහෙයවා ඇත.

වසර විසි දෙකකට කිට්ටු කාලයක් කේසී නගර සභාව තුල හැදුන වැඩුන ඇය Dandenong, High school හා Oakhigh secred Hearts Girls College වලින් උසස් අධ්‍යාපනය ලැබුවාය. ඉන් පසු මොනෑෂ් සරසවියේ International studies සහ Sustainability විෂයයන් ඇතුලත් ශාස්ත්‍රපති උපාධිය ලැබුවේ 2016 වසරේ දීය.

මොනෑෂ් සරසවියේ සියලු ශිෂ්‍ය සංගම් වල උපදේශක වරියක් වූ ඇය මුල් වසර කීපයේ ශ්‍රී ලාංකික ශිෂ්‍ය සංගමයේ කළමණාකාරණ කමිටුවේ සාමාජිකාවක් හා භාණ්ඩාගාරික තනතුරද උසුලා ඇත.

දැනට කේසි නගරසභාවේ (City of Casey) Conservation Advisory කමිටුවේද සාමාජිකාවක් වන ඇය AMEWS අධ්‍යාපන ආයතනයේ මෙරටට ලඟදී සංක්‍රමණය වූවන් හට ඕස්ට්‍රේලියාවේ සිරිත් විරිත් භාෂාව පිළිබඳ දැනුම ලබා දෙන්නීය.

මීට අමතරව ශ්‍රී ලාංකික විශේෂ උත්සව හා සැමරීම් වලදී ඇයගේ පූර්ණ සහයෝගය ලබා දෙන අතර සුහදශීලී අයකු ලෙස කාගේත් පැසසුමට ලක් වන්නියකි.

ඇයගේ ප්‍රධාන අරමුණ වන්නේ කේසි නගර සභාව තුල බහු ජාතික සමගිය සහයෝගීතාවය ඇති කිරීමත් සමග සැමදෙනාටම ලැබිය හැකි උපරිම පහසුකම් ලාබ ගැනීමත් එමගින් ඔවුන්ගේ බදු ගෙවන්නන්ගේ ආර්ථික, සෞඛ්‍යමය, නීතිමය හා අන්‍යෝන්‍ය සුරක්ෂිතභාවය වැඩි කිරීමයි.

විශේෂයෙන්ම නගර සභා ප්‍රදේශය තුල තරුණ තරුණියන්ට සුදුසු රැකියා පුහුණුව සඳහා යටිතල පහසුකම් හා මූල්‍ය පහසුකම් නගර සභාවෙන් ලබා ගැනීම ඇයගේ අරමුණක්.

වික්ටෝරියාවේ වේගයෙන්ම සංවර්ධනය වන නගර සභා අතුරින් දෙවැනි තැන හිමි වනුයේ කසළුහ දං කීෑහ නගර සභාව වන අතර වැඩිපුර ශ්‍රී ලාංකිකයන් පිරිසක් ස්ථිරව පදිංචි වී සිටිති.

Spring Field ආසනය තුල ඡන්ද දායකයන් 31000 ක් පමණ පදිංචි වී සිටින බව ද 16000 ක් පමණ නිවාස ඇති අතර ඉන් 1500 ක් පමණ ශ්‍රී ලාංකිකයන් ගේ බවද වාර්තා වේ.

Spring Field (wwd) ආසනයට ඇතුලත් වන්නේ Monash Freeway එකෙන් දකුණ පස Fountain Gate ප්‍රදේශය Princes Highway මාර්ගය දෙපස හා Narre warren Cranbourne පාරේ Thompson පාර දක්වා Cranbourn උතුර ප්‍රදේශය ද Hapmton Park සිට අධිබල විදුලි රැහැන් සමග Hallam Narrewarren Creek මායිම් ඇතුළුව Monsh Free way දක්වාද Narrewarren (South) දකුණු ප්‍රදේශය ද වේ.

මෙම නගර සභා මැතිවරණයෙන් කසුනි මෙන්ඩිස් ජය ගතහොත් ප්‍රථම ශ්‍රී ලාංකික කාන්තා නගර සභා මන්ත්‍රීවරිය විය හැකිය.

එම නිසා මෙය කියවන ඔබ දන්නා අය Spring Field ආසනය තුල සිටී නම් ඇය හට ඡන්දය පාවිච්චි කරන ලෙස දැනුවත් කරන්න.

ඔබගේ ඉල්ලීම් ඇත්නම් ඒ ගැන නගර සබාවට දැනුම් දීමටද කැමැත්තෙන් සිටින්නීය. එවැනි ඉල්ලීම් ඇත්නම් ඇය වෙත යොමු කරන්න පහත ලිපිනයට.

Kusuni Mendis for Casey Council Springfield wwd
Kasunimendis.sprinfield@gmail.com
M. 0481125395